# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | |
|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | |
| ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 | |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | |
| වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | |


| | |
|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1014/ 2024 |
| ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 16/06/2024<br>පැය 1505 |

## මාධ්‍ය නිවේදනය

### පොලිස් රථ වාහන අංශ වලට අනුයුක්තව රාජකාරී යෙදෙන නිලධරයන්ට ගෙවනු ලබන ත්‍යාග මුදල් වැඩි කිරීම.

පොලිස් රථ වාහන අංශ වලට අනුයුක්තව රාජකාරියේ යෙදෙන පොලිස් නිලධරයන් දෛනිකව අධික පැය ගණනක් මහා මාර්ග වල විවිධ දුශ්කරතා මධ්‍යයේ තම රාජකාරිය ඉටු කරනු ලබයි. එහිදී දැඩි අව් රශ්මිය මෙන්ම දැඩි වර්ශාව මධ්‍යයේ වුවද මාර්ග අනතුරු වලක්වා ගනිමින් ජාතික ධනය ඉතිරිකර මහජනතාවගේ ජීවිත හානි සහ දේපල හානි අවම කර ගැනීමට කටයුතු කර ගනිමින් මගීන් සුරක්ෂිත කිරීම සඳහා තම රාජකාරිය කැප වීමෙන් යුතුව ඉටු කරනු ලබයි. රථ වාහන හසුරුවන පොලිස් නිලධාරීයා තම රාජකාරිය ආරම්භ කළ මොහොතේ පටන් අවසන් වන තෙක්ම මාර්ගයේ සිටගෙන සිටිමින් තම රාජකාරිය ඉටු කිරීම හා වාහන වලින් පිට වන විෂ දුමාරය නිරන්තරයෙන්ම ආග්‍රහණය විමෙන් ඔවුන්ගේ ශරීර සෞඛ්‍යටද අහිතකර බලපෑමක් සිදු වී ඇත. නමුත් රථ වාහන අංශයට අනුයුක්තව රාජකාරී කරනු ලබන පොලිස් නිලධාරීන් මෙවැනි තත්ත්වයන්ද නොසලකා හරිමින් මහජනතාව සමඟ නිරන්තරයෙන් සම්බන්ධ වෙමින් ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් දෛනිකව දැඩි වෙහෙසකාරී රාජකාරියක් ඉටු කරනු ලබයි.

ඉහත කරුණු පිළිබඳව පොලිස්පති තුමාගේ දැඩි අවධානය යොමු වී තිබූ අතර ඒ අනුව පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා විසින් විශේෂ චක්‍ර ලේඛයක් නිකුත් කර වසර 13 කට පසු, පොලිස් රථ වාහන අංශ වලට අනුයුක්තව රාජකාරී සිදු කරන නිලධාරීන් වෙත මෙතෙක් ගෙවනු ලැබූ ත්‍යාග මුදල් වැඩි කර මාසිකව ගෙවීමට තීරණය කර ඇත.

ඒ අනුව පහත පරිදි රථ වාහන අංශයට අනුයුක්ත නිලධාරීනගේ ගෙවනු ලබන ත්‍යාග මුදල් වැඩි කර ඇත.

| නිලය | පෙර ගෙවූ මුදල | දැන් ගෙවන මුදල |
|---|---|---|
| **ස්ථානාධිපති රථවාහන** | **2500.00** | **7000.00** |
| **පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන්** | **2000.00** | **7000.00** |
| **පොලිස් සැරයන්** | **1800.00** | **6000.00** |
| **පොලිස් කොස්තාපල්** | **1600.00** | **6000.00** |
| **පොලිස් කොස්තාපල් රියදුරු** | **1200.00** | **4000.00** |

වර්තමානය වන විට මහා මාර්ග වල වාහන තදබදය වැඩි වීමෙන් මාර්ග වල ගමනා ගමනයේ අපහසුතාවයන් මතු වී ඇත. මෙහිදී ඇතිවන අධික වාහන තදබදය අවම කර ගනිමින් වාහන සුමට ගලනයක් සඳහා අවශ්‍ය රථවාහන පාලනය කරමින් සිදුකරන පොලිස් රාජකාරිය තුල ජනතාවගේ දෛනික ගමනාගමනය පහසු කරවීමට හැකියාව ලැබී ඇත. ඒ අනුව වෙහෙසකර රාජකාරියක නියුතු වන රථ වාහන අංශ වල නිලධාරීන්ගේ රාජකාරිය අගය කිරීම හා ඔවුන්ගේ සුභසාධනය ඉහළ නැංවීම මෙම ත්‍යාග මුදල් වැඩි කිරීම තුළින් අපේක්ෂා කෙරේ.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**